# 1. 3. 10.

## චූළසාරෝපම සූත්‍රය

1 මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්** නුවර සමීපයෙහි වූ **ජේතවන** නම් වූ අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක. ඉක්බිති **පිඞ්ගලකොච්ඡ** නම් බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියේ ය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතු සිහිකට යුතු කථා කොට නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන්නා වූ පිඞ්ගාලකොච්ඡ බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය:

2. භවත් ගෞතමයන් වහන්ස, පැවිදිසමූහයා ඇති පැවිදිගණයා ඇති ගණාචාර්‍ය්‍ය වූ ප්‍රසිද්ධ වූ යශස් ඇති තීර්ථඞ්කර වූ (=ලබ්ධි උපදවන්නා වූ) බොහෝ දෙනා විසින් සාධුයයි සම්මත කරණ ලද යම් මේ මහණබමුණු කෙනෙක් වෙත් ද, එනම්: **පූරණ කාශ්‍යප, මක්ඛලි ගෝසාල, අජිතකේසකම්බල, පකුධකච්චායන, සඤ්ජයබෙල්ලට්ඨිපුත්ත, නිගණ්ඨනාතපුත්ත,** යන මොහු ය. ඒ සියල්ලෝ ස්වකීය ප්‍රතිඥාව පරිදි (ස්වසමය නෛර්‍ය්‍යාණික යයි) දත ගත්තාහු ද? සියල්ලෝ ම දත නො ගත්තාහු ද? නැතහොත් සමහරු දත ගත්තාහු ද? සමහරු දත නො ගත්තාහු දැයි (ඇසීය.)

3. බමුණ, කම් නැත. 'ඒ සියල්ලෝ ස්වකීය ප්‍රතිඥාව පරිදි දත ගත්තාහු ද? සියල්ලෝ ම දත නො ගත්තාහු ද? නැතහොත් සමහරු දත ගත්තාහු ද? සමහරු දත නො ගත්තාහු ද? යන මෙය තිබියේවා. බමුණ, මම තට ධර්මය දේශනා කරන්නෙමි. එය අසව. මනා කොට මෙනෙහි කරව. දේශනා කරන්නෙමි. පිඞ්ගලකොච්ඡ බ්‍රාහ්මණ තෙමේ 'එසේ ය පින්වතුන් වහන්සැ'යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

4 බමුණ, යම් සේ හරයෙන් ප්‍රයෝජන ඇත්තා වූ, හර සොයනසුලු වූ, හර සෙවීමෙහි හැසිරෙන්නා වූ, පුරුෂයෙක් පිහිටා පවත්නා, අරටුව ඇති, මහරුකෙක හර ඉක්මවා ඵලය ඉක්මවා සිවිය ඉක්මවා පොත්ත ඉක්මවා හරය යි හඟනේ අතු කොළ කපා ගෙණ යන්නේ ද, ඇස් ඇති පුරුෂයෙක් තෙමේ ඒ මොහු දක "ඒකාන්තයෙන් මේ භවත් පුරුෂ තෙමේ හරය නො දන්නේ ය. ඵලය නො දන්නේ ය සිවිය නො දන්නේ ය. පොත්ත නො දන්නේ ය. කොළ අතු නො දන්නේ ය. එහෙයින් ම මේ භවත් පුරුෂ තෙමේ ද හරය ප්‍රයෝජන කොට ඇත්තේ හරය සොයනසුලු වූයේ හර සෙවීමෙහි හැසිරෙන්නේ නො වැපී පවත්නා වූ, හරය ඇති, මහරුකෙක හරය ඉක්මවා ම ඵලය ඉක්මවා ම සිවිය ඉක්මවා ම, පොත්ත ඉක්මවා ම හර යයි හඟමින් අතු කොළ කපා ගෙණ ගියේ ය. මොහු විසින් හරයෙන් කට යුතු යමක් වේ නම්, හරය පිළිබඳ ඒ ප්‍රයොජන ද (හෙතෙමේ) නො ලබන්නේ ය"යි මෙසේ කියන්නේ ය.

5. සෙය්‍යථාපි වා පන බ්‍රාහ්මණ පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො අතික්කම්මෙව සාරං අතික්කම්ම ඵෙග්ගුං අතික්කම්ම තචං පපටිකං ඡෙත්වා ආදාය පක්කමෙය්‍ය සාරන්ති මඤ්ඤමානො, තමෙනං චක්ඛුමා පුරිසො දිස්වා එවං වදෙය්‍ය: 'න වතායං භවං පුරිසො අඤ්ඤාසි සාරං, න අඤ්ඤාසි ඵෙග්ගුං, න අඤ්ඤාසි තචං, න අඤ්ඤාසි පපටිකං, න අඤ්ඤාසි සාඛාපලාසං. තථා හයං භවං පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො අතික්කම්මෙව සාරං අතික්කම්ම ඵෙග්ගුං අතික්කම්ම තචං පපටිකං ඡෙත්වා ආදාය පක්කන්තො සාරන්ති මඤ්ඤමානො, යඤ්චස්ස සාරෙන සාරකරණීයං තඤ්චස්ස අත්ථං නානුභවිස්සතී'ති.

6. සෙය්‍යථාපි වා පන බ්‍රාහ්මණ පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො අතික්කම්මෙව සාරං අතික්කම්ම ඵෙග්ගුං තචං ඡෙත්වා ආදාය පක්කමෙය්‍ය සාරන්ති මඤ්ඤමානො, තමෙනං චක්ඛුමා පුරිසො දිස්වා එවං වදෙය්‍ය: 'න වතායං භවං පුරිසො අඤ්ඤාසි සාරං, න අඤ්ඤාසි ඵෙග්ගුං, න අඤ්ඤාසි තචං, න අඤ්ඤාසි පපටිකං, න අඤ්ඤාසි සාඛාපලාසං. තථා හයං භවං පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො අතික්කම්මෙව සාරං අතික්කම්ම ඵෙග්ගුං තචං ඡෙත්වා ආදාය පක්කන්තො සාරන්ති මඤ්ඤමානො, යඤ්චස්ස සාරෙන සාරකරණීයං තඤ්චස්ස අත්ථං නානුභවිස්සතී'ති.

7. සෙය්‍යථාපි වා පන බ්‍රාහ්මණ පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො අතික්කම්මෙව සාරං ඵෙග්ගුං ඡෙත්වා ආදාය පක්කමෙය්‍ය සාරන්ති මඤ්ඤමානො, තමෙනං චක්ඛුමා පුරිසො දිස්වා එවං වදෙය්‍ය: 'න වතායං භවං පුරිසො අඤ්ඤාසි සාරං, න අඤ්ඤාසි ඵෙග්ගුං, න අඤ්ඤාසි තචං, න අඤ්ඤාසි පපටිකං, න අඤ්ඤාසි සාඛාපලාසං. තථා හයං භවං පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො අතික්කම්මෙව සාරං ඵෙග්ගුං ඡෙත්වා ආදාය පක්කන්තො සාරන්ති මඤ්ඤමානො, යඤ්චස්ස සාරෙන සාරකරණීයං තඤ්චස්ස අත්ථං නානුභවිස්සතී'ති.

5. බමුණ, යම් සේ හරයෙන් ප්‍රයෝජන ඇත්තා වූ හර සොයනසුලු වූ, හර සෙවීමෙහි හැසිරෙන්නා වූ පුරුෂයෙක් පිහිටා පවත්නා, හර ඇති මහරුකෙක හරය ඉක්මවා එළය ඉක්මවා සිවිය ඉක්මවා හරය යි හඟිමින් පොත්ත කපා ගෙණ යන්නේ ද, ඇස් ඇති පුරුෂයෙක් ඒ මොහු දක "මේ භවත් පුරුෂ තෙම අරටුව නො දන්නේ ය. එළය නො දන්නේ ය. සිවිය නො දන්නේ ය. පොත්ත නො දන්නේ ය. කොල අතු නො දන්නේ ය. එහෙයින් ම මේ භවත් පුරුෂ තෙමේ හරය ප්‍රයොජන කොට ඇත්තේ හරය සොයනසුලු වූයේ, හර සෙවීමෙහි හැසිරෙන්නේ නො වැටී පවත්නා වූ, හර ඇති මහත් රුකෙක හරය ඉක්මවා ම එළය ඉක්මවා සිවිය ඉක්මවා හරය යි හඟිමින් පොතු කපා ගෙණ ගියේ ය. ඔහුට හරයෙන් කට යුතු යමක් වී නම්, හරය පිළිබඳ ඒ ප්‍රයොජනය ද නො ලබන්නේය"යි මෙසේ කියන්නේ ය.

6. බමුණ, යම්සේ හරයෙන් ප්‍රයෝජන ඇත්තා වූ හර සොයනසුලු වූ හර සෙවීමෙහි හැසිරෙන්නා වූ පුරුෂයෙක් නො වැටී පවත්නා, හර ඇති මහත් රුකෙක අරටුව ඉක්මවා, එළය ඉක්මවා, හරය යි හඟිමින් සිවිය සිඳ ගෙණ යන්නේ ද, ඇස් ඇති පුරුෂයෙක් ඒ මොහු දක "මේ භවත් පුරුෂ තෙමේ. අරටුව නො දන්නේ ය. එළය නො දන්නේ ය. සිවිය නො දන්නේ ය. පොත්ත නො දන්නේ ය. අතු කොල නො දන්නේ ය. එහෙයින් ම මේ භවත් පුරුෂ තෙමේ හරය ප්‍රයොජන කොට ඇත්තේ හරය සොයනසුලු වූයේ, හරය සෙවීමෙහි හැසිරෙන්නේ පිහිටා පවත්නා වූ, හර ඇති මහත් රුකෙක හරය ඉක්මවා ම එළය ඉක්මවා හරය යි හඟිමින් සිවිය කපා ගෙණ ගියේ ය. ඔහුට හරයෙන් කට යුතු යමක් වේ නම්, හරය පිළිබඳ ඒ අර්ථය ද නො ලබන්නේය"යි මෙසේ කියන්නේ ය.

7. බමුණ, යම් සේ හරයෙන් ප්‍රයෝජන ඇත්තා වූ හර සොයන හර සෙවීමෙහි හැසිරෙන්නා වූ පුරුෂයෙක් නො වැටී පවත්නා, අරටුව ඇති මහත් රුකෙක හරය ඉක්මවා ම හරය යි හඟිමින් එළය කපා ගෙණ යන්නේ ද, ඇස් ඇති පුරුෂයෙක් ඒ මොහු දක "මේ භවත් පුරුෂ තෙම එකාන්තයෙන් අරටුව නො දන්නේ ය. එළය නො දන්නේ ය. සිවිය නො දන්නේ ය. පොත්ත නො දන්නේ ය. කොල අතු නො දන්නේ ය. එහෙයින් මේ භවත් පුරුෂ තෙමේ හරය ප්‍රයොජන කොට ඇත්තේ හරය සොයනසුලු වූයේ හර සෙවීමෙහි හැසිරෙන්නේ නො වැටී පවත්නා වූ, හර ඇති මහත් රුකෙක හරය ඉක්මවා ම හරය යි හඟිමින් එළය කපා ගෙණ ගියේ ය. ඔහුට හරයෙන් කට යුතු යමක් වේ නම්, හරය පිළිබඳ ඒ ප්‍රයොජනය ද නො ලබන්නේය"යි මෙසේ කියන්නේ ය.

8. සෙය්‍යථාපි වා පන බ්‍රාහ්මණ පුරිසො සාරත්‍ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො සාරඤ්ඤෙව ඡෙත්වා ආදාය පක්කමෙය්‍ය සාරන්ති ජානමානො, තමෙනං චක්ඛුමා පුරිසො දිස්වා එවං වදෙය්‍ය: ‘අඤ්ඤාසි වතායං භවං පුරිසො සාරං, අඤ්ඤාසි ඵෙග්ගුං, අඤ්ඤාසි තචං, අඤ්ඤාසි පපටිකං, අඤ්ඤාසි සාඛාපලාසං. තථා හයං භවං පුරිසො සාරත්‍ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො සාරඤ්ඤෙව ඡෙත්වා ආදාය පක්කන්තො සාරන්ති ජානමානො. යඤ්චස්ස සාරෙන සාරකරණීයං තඤ්චස්ස අත්‍ථං අනුභවිස්සතී’ති.

9. එවමෙව ඛො බ්‍රාහ්මණ ඉධෙකච්චො පුග්ගලො සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති: ඔතිණ්ණොම්හි ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, දුක්ඛොතිණ්ණො දුක්ඛපරෙතො, අප්පෙව නාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථාති. සො එවං පබ්බජිතො සමානො ලාභසක්කාරසිලොකං අභිනිබ්බත්තෙති සො තෙන ලාභසක්කාරසිලොකෙන අත්තමනො හොති පරිපුණ්ණසඞ්කප්පො. සො තෙන ලාභසක්කාරසිලොකෙන අත්තානුක්කංසෙති පරං වම්භෙති: ‘අහමස්මි ලාභී සිලොකවා[1], ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ අප්පඤ්ඤාතා අප්පෙසක්ඛා’ති. ලාභසක්කාරසිලොකෙන ච යෙ අඤ්ඤෙ ධම්මා උත්තරිතරා ච පණීතතරා ච තෙසං ධම්මානං සච්ඡිකිරියාය න ඡන්දං ජනෙති න වායමති. ඔලීනවුත්තිකො ච හොති සාථලිකො. සෙය්‍යථාපි සො බ්‍රාහ්මණ පුරිසො සාරත්‍ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො අතික්කම්මෙව සාරං අතික්කම්ම ඵෙග්ගුං අතික්කම්ම තචං අතික්කම්ම පපටිකං සාඛාපලාසං ඡෙත්වා ආදාය පක්කන්තො සාරන්ති මඤ්ඤමානො, යඤ්චස්ස සාරෙන සාරකරණීයං තඤ්චස්ස අත්‍ථං නානුභවිස්සති’[2] තථූපමාහං බ්‍රාහ්මණ ඉමං පුග්ගලං වදාමි.

10. ඉධ පන බ්‍රාහ්මණ එකච්චො පුග්ගලො සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති: ඔතිණ්ණොම්හි ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, දුක්ඛොතිණ්ණො දුක්ඛපරෙතො, අප්පෙව නාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථාති. සො එවං පබ්බජිතො සමානො ලාභසක්කාරසිලොකං අභිනිබ්බත්තෙති. සො තෙන ලාභසක්කාරසිලොකෙන න අත්තමනො හොති න පරිපුණ්ණසඞ්කප්පො. සො තෙන ලාභසක්කාරසිලොකෙන න අත්තානුක්කංසෙති න පරං වම්භෙති. ලාභසක්කාරසිලොකෙන ච යෙ අඤ්ඤෙ ධම්මා උත්තරිතරා ච පණීතතරා ච තෙසං ධම්මානං සච්ඡිකිරියාය ඡන්දං ජනෙති වායමති -

1. ලාභසක්කාරසිලොකවා, මජසං. ලාභී සක්කාරසිලොකවා, සයා.
2. නානුභවිස්සතීති, සයා.

Free Distribution www.aathaapi.org

8. බමුණ, යම් සේ හර ප්‍රයෝජන කොට ඇත්තා වූ හර සොයනුසුලු වූ හර සෙවීමෙහි හැසිරෙන්නා වූ පුරුෂයෙක් නො වැටී පවත්නා, හර ඇති මහ රුකෙක හරය යි දකිමින් හරය ම කපා ගෙණ යන්නේ ද, ඇස් ඇති පුරුෂයෙක් තුලුහු දැක 'එකාන්තයෙන් මේ භවත් පුරුෂ තෙමේ හරය දන්නේ ය. එළය දන්නේ ය. සිවිය දන්නේ ය. පොත්ත දන්නේය. කොල අතු දන්නේ ය. එහෙයින් ම මේ භවත් පුරුෂ තෙම් හරය ප්‍රයොජන කොට ඇත්තේ හරය සොයනුසුලු වූයේ හරය සෙවීමෙහි හැසිරෙන්නේ නො වැටී පවත්නා වූ හරය ඇති මහත් රුකෙක හරය යි දන්නේ හරය ම කපා ගෙණ ගියේ ය. ඔහුට හරයෙන් කට යුතු යමක් වේ නම් හරය පිළිබඳ ඒ ප්‍රයොජනය ද ලබන්නේය'යි මෙසේ කියන්නේ ය.

9 බමුණ, එපරිද්දෙන් ම මේ ලෝකයෙහි ඇතැම් කුලපුත්‍රයෙක් 'ජාතියෙන් ජරා මරණයෙන් ශොකයෙන් වැලපීමෙන් දුකින් දොම්නසින් උපායාසයෙන් මැඩුනෙම් වෙමි. දුකෙහි බටුයෙම් වෙමි. දුකින් පෙළුනෙම් වෙමි. මේ හුදු දුක්රැස කෙළවර කිරීම පෙණේ නම් ඉතා යෙහෙකැ'යි ශ්‍රද්ධාවෙන් ගිහි ගෙයින් නික්ම පැවිද්දට පැමිණියේ වෙයි. මෙසේ හෙතෙම පැවිදි වූයේ ලාභසත්කාරකීර්තිප්‍රශංසා උපදවයි. හෙතෙම ඒ ලාභසත්කාරකීර්තිප්‍රශංසාවෙන් සතුටු වූයේ පරිපූර්ණ සඞ්කල්පනා ඇත්තේ වෙයි. හෙතෙම ඒ ලාභසත්කාරකීර්තිප්‍රශංසාවෙන් 'මම ලාභී වෙමි. කීර්ති ඇත්තෙම් වෙමි. මේ අනික් භික්ෂූහු අප්‍රකටයෝ ය. අල්පෙශාක්‍යයෝ ය'යි තමන් හුවා දක්ව යි. මෙරමා හෙළා දක්ව යි. ලාභසත්කාරකීර්තිප්‍රශංසාවෙන් අන්‍ය වූ උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද යම් ධර්මයෝ වෙත් නම්, ඒ ධර්මයන් සාක්ෂාත් කිරීම පිණිස කත්‍රුකම්‍යතා ඡන්දය ඇති නො කරයි. වෑයම් නො කරයි. හිනාධ්‍යාශය ඇත්තේ වෙයි. ශාසනය ලිහිල් කොට ගත්තේ වෙයි. බමුණ යම් සේ හර ප්‍රයෝජන කොට ඇති හර සොයනුසුලු වූ හර සෙවීමෙහි හැසිරෙන්නා වූ පුරුෂයෙක් තෙමේ නො වැටී පවත්නා වූ, හර ඇති මහරුකෙක හරය ඉක්මවා ම එළය ඉක්මවා සිවිය ඉක්මවා පොත්ත ඉක්මවා හර යයි හඟතේ කොල අතු කපා ගෙණ ගියේ ද, ඔහුට හරයෙන් කළ යුතු යමක් වේ නම්, හරය පිළිබඳ ඒ අර්ථය ද නො ලබන්නේ ය. බමුණ, මම මේ පුද්ගලයා එවැනි උපමා ඇත්තෙකැ යි කියමි.

10. බමුණ, මේ ලෝකයෙහි ඇතැම් කුලපුත්‍රයෙක් 'ජාතියෙන් ජරා මරණයෙන් ශෝකයෙන් වැලපීමෙන් දුකින් දොම්නසින් දැඩි ආයාසයෙන් මැඩුනෙම් වෙමි. දුකෙහි බැස ගත්තෙම් වෙමි. දුකින් පෙළුනෙම් වෙමි. මේ හුදු දුක්රැස කෙළවර කිරීම පෙණේ නම්, ඉතා යෙහෙකැ'යි ශ්‍රද්ධාවෙන් ගිහි ගෙන් නික්ම පැවිද්දට පැමිණියේ වෙයි. හෙතෙම මෙසේ පැවිදි වූයේ ලාභසත්කාරකීර්තිප්‍රශංසාවන් උපදවයි. හෙතෙම ඒ ලාභසත්කාරකීර්තිප්‍රශංසාවෙන් නො සතුටු වූයේ පරිපූර්ණසඞ්කල්පනා ඇත්තේ නො වෙයි. හෙතෙම ඒ ලාභසත්කාරකීර්තිප්‍රශංසාවෙන් තමන් හුවා නො දක්වයි. මෙරමා හෙළා නො දක්වයි. ලාභසත්කාරකීර්තිප්‍රශංසාවෙන් උත්තරීතර වූ ද, ප්‍රණීතතර වූ ද ධර්මයෝ වෙත් නම්, ඒ අන්‍ය ධර්මයන් ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස ඡන්දය උපදව යි. වෑයම් කරයි.-

අනොලීනවුත්තිකො ච හොති අසාථලිකො. සො සීලසම්පදං ආරාධෙති. සො තාය සීලසම්පදාය අත්තමනො හොති පරිපුණ්ණසඞ්කප්පො. සො තාය සීලසම්පදාය අත්තානුක්කංසෙති පරං වම්භෙති: 'අහමස්මි සීලවා කල්‍යාණධම්මො, ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ දුස්සීලා පාපධම්මා'ති. සීලසම්පදාය ච යෙ අඤ්ඤෙ ධම්මා උත්තරිතරා ච පණීතතරා ච තෙසං ධම්මානං සච්ඡිකිරියාය න ඡන්දං ජනෙති න වායමති. ඔලීනවුත්තිකො ච හොති සාථලිකො. සෙය්‍යථාපි සො බ්‍රාහ්මණ පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො අතික්කම්මෙව සාරං අතික්කම්ම ඵෙග්ගුං අතික්කම්ම තචං පපටිකං ඡෙත්වා ආදාය පක්කන්තො, සාරන්ති මඤ්ඤමානො, යඤ්චස්ස සාරෙන සාරකරණීයං තඤ්චස්ස අත්ථං නානුභවිස්සති. තථූපමාහං බ්‍රාහ්මණ ඉමං පුග්ගලං වදාමි.

11. ඉධ පන බ්‍රාහ්මණ එකච්චො[1] පුග්ගලො සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති: ඔතිණ්ණොම්හි ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, දුක්ඛොතිණ්ණො දුක්ඛපරෙතො, අප්පෙව නාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථා'ති. සො එවං පබ්බජිතො සමානො ලාභසක්කාරසිලොකං අභිනිබ්බත්තෙති. සො තෙන ලාභසක්කාරසිලොකෙන න අත්තමනො හොති න පරිපුණ්ණසඞ්කප්පො. සො තෙන ලාභසක්කාරසිලොකෙන න අත්තානුක්කංසෙති න පරං වම්භෙති. ලාභසක්කාරසිලොකෙන ච යෙ අඤ්ඤෙ ධම්මා උත්තරිතරා ච පණීතතරා ච තෙසං ධම්මානං සච්ඡිකිරියාය ඡන්දං ජනෙති වායමති. අනොලීනවුත්තිකො ච හොති අසාථලිකො. සො සීලසම්පදං ආරාධෙති, සො තාය සීලසම්පදාය අත්තමනො හොති නො ච ඛො පරිපුණ්ණසඞ්කප්පො. සො තාය සීලසම්පදාය න අත්තානුක්කංසෙති න පරං වම්භෙති. සීලසම්පදාය ච යෙ අඤ්ඤෙ ධම්මා උත්තරිතරා ච පණීතතරා ච තෙසං ධම්මානං සච්ඡිකිරියාය ඡන්දං ජනෙති වායමති. අනොලීනවුත්තිකො ච හොති අසාථලිකො. සො සමාධිසම්පදං ආරාධෙති. සො තාය සමාධිසම්පදාය අත්තමනො හොති පරිපුණ්ණසඞ්කප්පො. සො තාය සමාධිසම්පදාය අත්තානුක්කංසෙති පරං වම්භෙති: අහමස්මි සමාහිතො එකග්ගචිත්තො, ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ අසමාහිතා විබ්භන්තචිත්තා'ති. සමාධිසම්පදාය ච යෙ අඤ්ඤෙ ධම්මා උත්තරිතරා ච පණීතතරා ච තෙසං ධම්මානං සච්ඡිකිරියාය න ඡන්දං ජනෙති න වායමති. ඔලීනවුත්තිකො ච හොති සාථලිකො. –

1 එකච්චො-පෙ-අන්තකිරියා, සයා.

නො පසුබට පැවැතුම් ඇත්තේ සපුත ලිහිල් කොට නො ගත්තේත් වෙයි. හෙතෙම ශීලසම්පත්තිය සම්පූර්ණ කරයි. හෙතෙම. ඒ ශීලසම්පත්තියෙන් සතුටු වූයේ පරිපූර්ණසඞ්කල්පනා ඇත්තේ වෙයි. හෙතෙම ඒ ශීලසම්පත්තියෙන් 'මම සිල්වත් වෙමි. කලණදහම් ඇත්තෙම් වෙමි. මේ අන්‍ය වූ භික්ෂූහු දුශ්ශීලයෝ ය. පවිටු සවභාව ඇත්තෝය'යි තමා හුවා දක්ව යි. මෙරමා හෙළා දක්ව යි. ශීලසම්පත්තියෙන් අන්‍ය වූ උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද යම් ධර්මයෝ වෙත් ද, ඒ අන්‍යධර්ම ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස ඡන්දය නූපදව යි වෑයම් නො කරයි. පසුබට පැවතුම් ඇත්තේ සපුත ලිහිල් කොට ගත්තේ වෙයි. බමුණ, යම් සේ හරය ප්‍රයොජන කොට ඇති හරය සොයනසුලු හර සෙවීමෙහි හැසිරෙන්නා වූ ඒ පුරුෂ තෙමේ නො වැටී සිටින්නා වූ හරය ඇති මහ රුකෙක හරය ඉක්මවා එළය ඉක්මවා සිවිය ඉක්මවා හර යයි හඟතේ පොත්ත කපා ගෙණ ගියේ ද, ඔහුට හරයෙන් කට යුතු යමක් වේ නම්, හරය පිළිබඳ ඒ ප්‍රයොජනය ද නො ලබන්නේ ය. බමුණ, මම ඒ පුද්ගලයා එබඳු උපමා ඇත්තෙකැ යි කියමි.

11 බමුණ, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් 'ජාතියෙන් ජරා මරණයෙන් ශෝකයෙන් වැළපීමෙන් දුකින් දොම්නසින් දැඩි ආයාසයෙන් මැඩුනෙම් දුකෙහි බැස ගත්තෙම් දුකින් පෙළුනෙම් වෙමි. මේ හුදු දුක්රැස කෙළවර, කිරීම පෙණේ නම්, ඉතා යෙහෙකැ'යි ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියේ වෙයි. හෙතෙම මෙසේ පැවිදි වූයේ ලාභසත්කාරකීර්තිප්‍රශංසාවන් උපදව යි. හෙතෙම ඒ ලාභසත්කාරකීර්තිප්‍රශංසාවෙන් සතුටු නො වෙයි. පරිපූර්ණසඞ්කල්පනා ඇත්තේ නො වෙයි. හෙතෙම ඒ ලාභසත්කාරකීර්තිප්‍රශංසාවෙන් තමන් හුවා නො දක්ව යි. මෙරමා හෙළා නො දක්ව යි. ලාභසත්කාරකීර්ති-ප්‍රශංසාවෙන් අන්‍ය වූ උත්තරීතර වූ ද ප්‍රණීතතර වූ ද යම් ධර්මයෝ වෙත් නම්, ඒ ධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස ඡන්දය උපදව යි. වෑයම් කරයි. නො පසු බස්නා පැවතුම් ඇත්තේ ශාසනය ලිහිල් කොට නො ගත්තේ වෙයි. හෙතෙම ශීලසම්පත්තිය සම්පූර්ණ කරයි. හෙතෙම ඒ ශීලසම්පත්තියෙන් සතුටු වූයේ ද පරිපූර්ණ සඞ්කල්පනා ඇත්තේ නො වෙයි. හෙතෙම ඒ ශීලසම්පත්තියෙන් තමන් හුවා නො දක්ව යි. මෙරමා හෙළා නො දක්ව යි. ශීලසම්පත්තියෙන් ද අන්‍ය වූ උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද යම් ධර්මයෝ වෙත් ද, ඒ ධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස ඡන්දය උපදව යි. වෑයම් කෙරෙ යි. නො පසුබස්නා පැවතුම් ඇත්තේ සපුත ලිහිල් කොට නො ගත්තේ ද වෙයි. හෙතෙම සමාධිසම්පත්තිය සම්පූර්ණ කරයි. හෙතෙම ඒ සමාධිසම්පත්තියෙන් සතුටු වූයේ පරිපූර්ණසඞ්කල්පනා ඇත්තේ වෙයි. හෙතෙම ඒ සමාධිසම්පත්තියෙන් 'මම සමාධියෙන් යුක්ත වූයෙම් එකඟ වූ සිත් ඇත්තෙම් වෙමි. මේ අන්‍ය වූ භික්ෂූහු අසමාහිතයෝ ය. විසුරුණු සිත් ඇත්තෝ ය'යි තමා හුවා දක්ව යි. මෙරමා හෙළා දක්ව යි. සමාධිසම්පත්තියෙන් ද අන්‍ය වූ උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද යම් ධර්මයෝ වෙත් ද, ඒ ධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස කත්තුකම්‍යතා ඡන්දය නූපදව යි. වෑයම් නො කෙරෙ යි. පසුබට පැවතුම් ඇත්තේ ශාසනය ලිහිල් කොට ගත්තේ ද වෙයි. –

සෙය්‍යථාපි සො බ්‍රාහ්මණ පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො අතික්කම්මෙව සාරං අතික්කම්ම ඵෙග්ගුං තචං ඡෙත්වා ආදාය පක්කන්තො සාරන්ති මඤ්ඤමානො, යඤ්චස්ස සාරෙන සාරකරණීයං තඤ්චස්ස අත්ථං නානුභවිස්සති. තථූපමාහං බ්‍රාහ්මණ ඉමං පුග්ගලං වදාමි.

12. ඉධ පන බ්‍රාහ්මණ එකච්චො පුග්ගලො සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති: ඔතිණ්ණොම්හි ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, දුක්ඛොතිණ්ණො දුක්ඛපරෙතො, අප්පෙව නාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථාති. සො එවං පබ්බජිතො සමානො ලාභසක්කාරසිලොකං අභිනිබ්බත්තෙති. සො තෙන ලාභසක්කාරසිලොකෙන න අත්තමනො හොති න පරිපුණ්ණසඞ්කප්පො. සො තෙන ලාභසක්කාරසිලොකෙන න අත්තානුක්කංසෙති න පරං වම්භෙති. ලාභසක්කාරසිලොකෙන ච යෙ අඤ්ඤෙ ධම්මා උත්තරිතරා ච පණීතතරා ච තෙසං ධම්මානං සච්ඡිකිරියාය ඡන්දං ජනෙති වායමති. අනොලීනවුත්තිකො ච හොති අසාථිලිකො. සො සීලසම්පදං ආරාධෙති. සො තාය සීලසම්පදාය අත්තමනො හොති නො ච ඛො පරිපුණ්ණසඞ්කප්පො. සො තාය සීලසම්පදාය න අත්තානුක්කංසෙති න පරං වම්භෙති. සීලසම්පදාය ච යෙ අඤ්ඤෙ ධම්මා උත්තරිතරා ච පණීතතරා ච තෙසං ධම්මානං සච්ඡිකිරියාය ඡන්දං ජනෙති වායමති. අනොලීනවුත්තිකො ච හොති අසාථිලිකො. සො සමාධිසම්පදං ආරාධෙති. සො තාය සමාධිසම්පදාය අත්තමනො හොති නො ච ඛො පරිපුණ්ණසඞ්කප්පො. සො තාය සමාධිසම්පදාය න අත්තානුක්කංසෙති න පරං වම්භෙති. සමාධිසම්පදාය ච යෙ අඤ්ඤෙ ධම්මා උත්තරිතරා ච පණීතතරා ච තෙසං ධම්මානං සච්ඡිකිරියාය ඡන්දං ජනෙති වායමති. අනොලීනවුත්තිකො ච හොති අසාථිලිකො. සො ඤාණදස්සනං ආරාධෙති. සො තෙන ඤාණදස්සනෙන අත්තමනො හොති පරිපුණ්ණසඞ්කප්පො. සො තෙන ඤාණදස්සනෙන අත්තානුක්කංසෙති පරං වම්භෙති: අහමස්මි ජානං පස්සං විහරාමි. ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ අජානං අපස්සං විහරන්තීති. ඤාණදස්සනෙන ච යෙ අඤ්ඤෙ ධම්මා උත්තරිතරා ච පණීතතරා ච තෙසං ධම්මානං සච්ඡිකිරියාය න ඡන්දං ජනෙති න වායමති. ඔලීනවුත්තිකො ච හොති සාථිලිකො. සෙය්‍යථාපි සො බ්‍රාහ්මණ පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො අතික්කම්මෙව සාරං ඵෙග්ගුං ඡෙත්වා ආදාය පක්කන්තො සාරන්ති මඤ්ඤමානො, යඤ්චස්ස සාරෙන සාරකරණීයං තඤ්චස්ස අත්ථං නානුභවිස්සති. තථූපමාහං බ්‍රාහ්මණ ඉමං පුග්ගලං වදාමි.

1. ජරායමරණෙන, මජසං. -පෙ- අන්තකිරියා, සයා.

බමුණ, යම් සේ හරය ප්‍රයෝජන කොට ඇති හරය සොයනසුලු හරය සෙවීමෙහි හැසිරෙන්නා වූ ඒ පුරුෂ තෙමේ නො වැටී පවත්නා වූ හර ඇත්තා වූ මහ රුකෙක හරය ඉක්මවා ම එළය ඉක්මවා හරය යි සඟතේ සිවිය කපා ගෙණ ගියේ ද, ඔහුට හරයෙන් කට යුතු යමක් වේ ද, හරය පිළිබඳ ඒ ප්‍රයොජනය ද නො ලබයි. බමුණ, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇත්තෙකැ යි කියමි.

12. බමුණ, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් 'ජාතියෙන් ජරාමරණයෙන් ශෝකයෙන් වැලපීමෙන් දුකින් දොම්නසින් දැඩි ආයාසයෙන් මැඩුනෙම් දුකට බටුයෙම් දුකින් පෙළුනෙම් වෙමි. මේ හුදු දුක්රැස කෙළවර කිරීම පෙණේ නම්, ඉතා යෙහෙකැ'යි ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියේ වෙයි. හෙතෙම මෙසේ පැවිදි වූයේ ලාභසත්කාරකීර්තිප්‍රශංසාවන් උපදවයි. හෙතෙම ඒ ලාභසත්කාරකීර්ති ප්‍රශංසාවෙන් සතුටු නො වූයේ පරිපූර්ණ සඞ්කල්පනා ඇත්තේ නො වෙයි. හෙතෙම ඒ ලාභසත්කාරකීර්තිශප්‍රංසාවෙන් තමන් හුවා නො දක්ව යි. මෙරමා හෙළා නො දක්ව යි. ලාභසත්කාරකීර්තිප්‍රශංසාවෙන් අන්‍ය වූ ද උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද, යම් ධර්මයෝ වෙත් ද, ඒ ධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස ඡන්දය උපදව යි. වෑයම් කරයි නො පසුබට පැවතුම් ඇත්තේ සපුත ලිහිල් කොට නො ගත්තේ ද වෙයි. හෙතෙම ශීලසම්පත්තිය සම්පූර්ණ කෙරෙ යි. හෙතෙම ඒ ශීලසම්පත්තියෙන් සතුටු වූයේ ද පරිපූර්ණ-සඞ්කල්පනා ඇත්තේ නො වෙයි. හෙතෙමේ ඒ ශීලසම්පත්තියෙන් තමන් හුවා නො දක්ව යි. මෙරමා හෙළා නො දක්ව යි. ශීලසම්පත්තියෙන් ද අන්‍ය වූ උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද යම් ධර්මයෝ වෙත් ද, ඒ ධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස ඡන්දය උපදව යි. වෑයම් කරයි. නො පසුබට පැවතුම් ඇත්තේ සපුන ලිහිල් කොට නො ගත්තේ ද වෙයි. හෙතෙම සමාධිසම්පත්තිය සම්පූර්ණ කරයි. හෙතෙම ඒ සමාධිසම්පත්තියෙන් සතුටු වූයේ පරිපූර්ණසඞ්කල්පනා ඇත්තේ ද නො වෙයි. හෙතෙම ඒ සමාධිසම්පත්තියෙන් තමන් හුවා නො දක්ව යි. මෙරමා හෙළා නො දක්ව යි. සමාධිසම්පත්තියෙන් ද අන්‍ය වූ උත්තරිතර වූ ද, ප්‍රණීතතර වූ ද යම් ධර්මයෝ වෙත් ද, ඒ ධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස ඡන්දය උපදව යි. වෑයම් කරයි. නො පසුබස්නා පැවතුම් ඇත්තේ සස්ත ලිහිල් කොට නො ගත්තේ ද වෙයි. හෙතෙම ඥානදර්ශනය (දිව්‍යචක්ෂුර් ඥානය) ලබයි. හෙතෙම ඒ ඥානදර්ශනයෙන් සතුටු වූයේ පරිපූර්ණසඞ්කල්පනා ඇත්තේ වෙයි. හෙතෙම ඒ ඥානදර්ශනයෙන් 'මම දන්නෙමි දක්නෙමි වාසය කරමි. මේ අන්‍ය භික්ෂූහු නො දන්නාහු නො දක්නාහු වෙසෙත්' යි තමන් හුවා දක්ව යි. මෙරමා හෙළා දක්ව යි. ඥානදර්ශනයෙන් ද අන්‍ය වූ උත්තරීතර වූ ද ප්‍රණීතතර වූ ද යම් ධර්මයෝ වෙත් ද ඒ ධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස කත්තුකම්‍යතා ඡන්දය නූපදව යි. වෑයම් නො කෙරෙ යි පසු බස්නා පැවතුම් ඇත්තේ සපුත ලිහිල් කොට ගත්තේ ද වෙයි. බමුණ, හර ප්‍රයෝජන කොට ඇති හර සොයනසුලු හර සෙවීමෙහි හැසිරෙන්නා වූ ඒ පුරුෂ තෙමේ යම් සේ නො වැටී පවත්නා වූ හර ඇත්තා වූ මහ රුකෙක හරය ඉක්මවා ම හරය යි හගිමින් එළය කපා ගෙණ ගියේ ද, ඔහුට හරයෙන් කටයුතු යමක් වී නම් හරය පිළිබඳ ඒ අර්ථය නො ලබන්නේ ය. බමුණ මම මේ පුද්ගලයා එබඳු උපමා ඇත්තෙකැ යි කියමි.

13. ඉධ පන බ්‍රාහ්මණ එකච්චො පුග්ගලො සද්ධා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති: ඔතිණ්ණොම්හි ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි, දුක්ඛොතිණ්ණො දුක්ඛපරෙතො. අප්පෙවනාම ඉමස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස අන්තකිරියා පඤ්ඤායෙථාති. සො එවං පබ්බජිතො සමානො ලාභසක්කාරසිලොකං අභිනිබ්බත්තෙති. සො තෙන ලාභසක්කාරසිලොකෙන න අත්තමනො හොති න පරිපුණ්ණසඞ්කප්පො. සො තෙන ලාභසක්කාරසිලොකෙන න අත්තානුක්කංසෙති න පරං වම්භෙති. ලාභසක්කාරසිලොකෙන ච යෙ අඤ්ඤෙ ධම්මා උත්තරිතරා ච පණීතතරා ච තෙසං ධම්මානං සච්ඡිකිරියාය ඡන්දං ජනෙති වායමති. අනොලීනවුත්තිකො ච හොති අසාථිලිකො. සො සීලසම්පදං ආරාධෙති. සො තාය සීලසම්පදාය අත්තමනො හොති නො ච ඛො පරිපුණ්ණසඞ්කප්පො. සො තාය සීලසම්පදාය න අත්තානුක්කංසෙති න පරං වම්භෙති. සීලසම්පදාය ච යෙ අඤ්ඤෙ ධම්මා උත්තරිතරා ච පණීතතරා ච තෙසං ධම්මානං සච්ඡිකිරියාය ඡන්දං ජනෙති වායමති. අනොලීනවුත්තිකො ච හොති අසාථිලිකො. සො සමාධිසම්පදං ආරාධෙති. සො තාය සමාධිසම්පදාය අත්තමනො හොති නො ච ඛො පරිපුණ්ණසඞ්කප්පො. සො තාය සමාධිසම්පදාය න අත්තානුක්කංසෙති න පරං වම්භෙති. සමාධිසම්පදාය ච යෙ අඤ්ඤෙ ධම්මා උත්තරිතරා ච පණීතතරා ච තෙසං ධම්මානං සච්ඡිකිරියාය ඡන්දං ජනෙති වායමති. අනොලීනවුත්තිකො ච හොති අසාථිලිකො. සො ඤාණදස්සනං ආරාධෙති. සො තෙන ඤාණදස්සනෙන අත්තමනො හොති නො ච ඛො පරිපුණ්ණසඞ්කප්පො. සො තෙන ඤාණදස්සනෙන න අත්තානුක්කංසෙති න පරං වම්භෙති. ඤාණදස්සනෙන ච යෙ අඤ්ඤෙ ධම්මා උත්තරිතරා ච පණීතතරා ච තෙසං ධම්මානං සච්ඡිකිරියාය ඡන්දං ජනෙති වායමති. අනොලීනවුත්තිකො ච හොති අසාථිලිකො.

14. කතමෙ ච බ්‍රාහ්මණ ධම්මා ඤාණදස්සනෙන උත්තරිතරා ච පණීතතරා ච?

ඉධ බ්‍රාහ්මණ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො බ්‍රාහ්මණ ධම්මො ඤාණදස්සනෙන උත්තරිතරො ච පණීතතරො ච.

13. බමුණ, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් 'ජාතියෙන් ජරාමරණයෙන් ශෝකයෙන් වැලපීමෙන් දුකින් දොම්නසින් දැඩි ආයාසයෙන් මැඩුනෙම් දුකට බටුයෙම් දුකින් පෙළුනෙම් වෙමි. මේ හුදු දුක්රැස කෙලවර කිරීම පෙණේ නම් ඉතා යෙහෙකැ' යි ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම පැවිද්දට පැමිණියේ වෙයි. මෙසේ හෙතෙම පැවිදි වූයේ ලාභසත්කාරකීර්තිප්‍රශංසාවන් උපදව යි. හෙතෙම ඒ ලාභසත්කාරකීර්ති-ප්‍රශංසාවෙන් සතුටු නො වූයේ පරිපූර්ණසඞ්කල්පනා ඇත්තේ නො වෙයි. හෙතෙම ඒ ලාභසත්කාරකීර්තිප්‍රශංසාවෙන් තමන් හුවා නො දක්ව යි. මෙරමා හෙළා නො දක්ව යි. ලාභසත්කාරකීර්තිප්‍රශංසායෙන් ද අන්‍ය වූ උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද යම් ධර්මයෝ වෙත් ද, ඒ ධර්මයන් ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස කත්තුකම්‍යතා ඡන්දය උපදව යි. වෑයම් කරයි. නො පසුබස්නා පැවතුම් ඇත්තේ සපුත ලිහිල් කොට නො ගත්තේ ද වෙයි. හෙතෙම ශීලසම්පත්තිය සම්පූර්ණ කෙරෙ යි. හෙතෙම ඒ ශීලසම්පත්තියෙන් සතුටු වූයේ ද පරිපූර්ණසඞ්කල්පනා ඇත්තේ නො වෙයි. හෙතෙමේ ඒ ශීලසම්පත්තියෙන් තමන් හුවා නො දක්ව යි. පරා හෙළා නො දක්ව යි. ශීලසම්පත්තියෙන් ද අන්‍ය වූ උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද යම් ධර්මයෝ වෙත් නම්, ඒ ධර්මයන් ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස කත්තුකම්‍යතා ඡන්දය උපදව යි. වෑයම් කරයි. නො පසුබට පැවතුම් ඇත්තේ සපුත ලිහිල් කොට නො ගත්තේ ද වෙයි. හෙතෙම සමාධිසම්පත්තිය සම්පූර්ණ කරයි. හෙතෙම ඒ සමාධිසම්පත්තියෙන් සතුටු වූයේ ද පරිපූර්ණසඞ්කල්පනා ඇත්තේ නො වෙයි. හෙතෙම ඒ සමාධිසම්පත්තියෙන් තමන් හුවා නො දක්ව යි. මෙරමා හෙළා නො දක්ව යි. සමාධිසම්පත්තියෙන් ද අන්‍ය වූ උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද යම් ධර්මයෝ වෙත් නම්, ඒ ධර්මයන් ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස කත්තුකම්‍යතා ඡන්දය උපද යි. වෑයම් කෙරෙ යි. නො පසුබස්නා පැවතුම් ඇත්තේ සපුත ලිහිල් කොට නො ගත්තේ ද වෙයි. හෙතෙම ඥානදර්ශනය ලබයි. හෙතෙම ඒ ඥානදර්ශනයෙන් සතුටු වූයේ ද පරිපූර්ණසඞ්කල්පනා ඇත්තේ නො වෙයි. හෙතෙම ඒ ඥානදර්ශනයෙන් තමා හුවා නො දක්ව යි. මෙරමා හෙළා නො දක්ව යි. ඥානදර්ශනයෙන් ද අන්‍ය වූ උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද යම් ධර්මයෝ වෙත් ද, ඒ ධර්මයන් ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස කත්තුකම්‍යතා ඡන්දය උපදව යි. වෑයම් කෙරෙ යි. නො පසුබස්නා පැවතුම් ඇත්තේ සපුත ලිහිල් කොට නො ගත්තේ ද වෙයි.

14. බමුණ, ඥානදර්ශනයට වඩා උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද ධර්මයෝ කවරහු ද?

බමුණ, මේ ශාසනයෙහි මහණ තෙමේ කාමයන්ගෙන් වෙන්ව ම අකුශලයන්ගෙන් වෙන්ව ම විතර්ක සහිත වූ විචාර සහිත වූ විවෙකයෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථමධ්‍යානය උපදවා වාසය කෙරෙ යි. බමුණ, මේ ද ඥානදර්ශනයට වඩා (නිරොධපාදක බැවින්) උත්තරිතර වූ ද, ප්‍රණීතතර වූ ද ධර්මයෙකි.

15. පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො බ්‍රාහ්මණ ධම්මො ඤාණදස්සනෙන උත්තරිතරො ච පණීතතරො ච.

16. පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො. සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යන්තං අරියා ආචික්ඛන්ති: 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තතියං ඣානං උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො බ්‍රාහ්මණ ධම්මො ඤාණදස්සනෙන උත්තරිතරො ච පණීතතරො ච.

17. පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථගමා[1] අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො බ්‍රාහ්මණ ධම්මො ඤාණදස්සනෙන උත්තරිතරො ච පණීතතරො ච.

18. පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා 'අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො බ්‍රාහ්මණ ධම්මො ඤාණදස්සනෙන උත්තරිතරො ච පණීතතරො ච

19. පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම 'අනන්තං විඤ්ඤාණන්ති' විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො බ්‍රාහ්මණ ධම්මො ඤාණදස්සනෙන උත්තරිතරො ච පණීතතරො ච

20 පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම 'නත්ථි කිඤ්චී'ති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො බ්‍රාහ්මණ ධම්මො ඤාණදස්සනෙන උත්තරිතරො ච පණීතතරො ච.

21. පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු සබ්බසො ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්ම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො බ්‍රාහ්මණ ධම්මො ඤාණදස්සනෙන උත්තරිතරො ච පණීතතරො ච.

1. අත්ථඞ්ගමා, මජසං. සයා.

Free Distribution www.aathaapi.org

15. බමුණ, නැවත ද අතිකක් වෙයි. මහණ තෙමේ විතර්කවිචාර-යන්ගේ සන්හිඳීමෙන් අධ්‍යාත්මයෙහි උපන් පැහැදීමෙන් යුත් සිතේ එකොදිසඛ්‍යාත සමාධිය වඩන විතර්ක රහිත වූ විචාර රහිත වූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කෙරේ යි. බමුණ, මෙද ඥානදර්ශනයට වඩා උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද ධර්මයෙකි.

16. බමුණ, නැවත ද අතිකක් වෙයි. මහණ තෙමේ ප්‍රීතියගේ ද විරාගයෙන් උපෙක්ෂකව සිහි ඇත්තේ සම්‍යක් ප්‍රඥ ඇත්තේ වෙසෙයි. සැපය ද කයින් විඳියි. යම් ඒ ධ්‍යානයක් හෙතු කොට ගෙණ ඒ පුද්ගලයා 'උපෙක්‍ෂා ඇත්තේ ය සිහි ඇත්තේ ය. සැපවිහරණ ඇත්තේ' යයි ආර්‍යයෝ කියද් ද, ඒ තෘතියධ්‍යානයට පැමිණ වාසය කෙරෙ යි. බමුණ, මෙ ද ඥානදර්ශනයට වඩා උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද ධර්මයෙකි

17. බමුණ, නැවත ද අතිකක් වෙයි. මහණ තෙමේ සුඛයාගේ ද ප්‍රහාණයෙන් දුඃඛයාගේ ද ප්‍රහාණයෙන් පෙරම සොම්නස් දොම්නස්හුගේ නැසීමෙන් තිදුක් වූ නො සැප වූ උපෙක්‍ෂාවෙන් කලසමෘති පාරිශුද්ධිය ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කෙරෙ යි. බමුණ, මෙ ද ඥානදර්ශනයට වඩා උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද ධර්මයෙකි.

18. බමුණ, නැවැත ද අතිකක් වෙයි. මහණ තෙමේ සර්වප්‍රකාරයෙන් රූපසංඥවන් නැසීමෙන් ප්‍රතිඝසංඥවන්ගේ ප්‍රහාණයෙන් නානාත්ව-සංඥවන් මෙනෙහි නො කිරීමෙන් 'ආකාශය අනන්ත ය'යි ආකාශානඤ්චා-යතනයට පැමිණ වාසය කෙරෙ යි. බමුණ මෙ ද ඥානදර්ශනයට වඩා උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද ධර්මයෙකි.

19. බමුණ, නැවත ද අතිකක් වෙයි. මහණ තෙමේ සර්වප්‍රකාරයෙන් ආකාශානඤ්චායතනය ඉක්මවා 'විඤ්ඤාණය අනන්ත ය'යි. විඤ්ඤාණඤ්චා-යතනයට පැමිණ වාසය කරයි. බමුණ, මෙ ද ඥානදර්ශනයට වඩා උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද ධර්මයෙකි.

20. බමුණ නැවත ද, අතිකක් වෙයි. මහණ තෙමේ සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා 'කිසිවක් නැතැ'යි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. බමුණ, මෙ ද ඥානදර්ශනයට වඩා උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද ධර්මයෙකි.

21. බමුණ, නැවත ද අතිකක් වෙයි. මහණ තෙමේ සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. බමුණ මේ ද ඥානදර්ශනයට වඩා උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද ධර්මයෙකි.

22. පුන ච පරං බ්‍රාහ්මණ භික්ඛු සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. පඤ්ඤාය චස්ස දිස්වා ආසවා පරික්ඛීණා හොන්ති. අයම්පි ඛො බ්‍රාහ්මණ ධම්මො ඤාණදස්සනෙන උත්තරිතරො ච පණීතතරො ච.

ඉමෙ ඛො බ්‍රාහ්මණ ධම්මා ඤාණදස්සනෙන උත්තරිතරා ච පණීතතරා ච.

සෙය්‍යථාපි සො බ්‍රාහ්මණ පුරිසො සාරත්ථිකො සාරගවෙසී සාරපරියෙසනං චරමානො මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො සාරඤ්ඤෙව ඡෙත්වා ආදාය පක්කමන්තො සාරන්ති ජානමානො, යඤ්චස්ස සාරෙන සාරකරණීයං තඤ්චස්ස අත්ථං අනුභවිස්සති. තථූපමාහං බ්‍රාහ්මණ ඉමං පුග්ගලං වදාමි.

23. ඉති ඛො බ්‍රාහ්මණ නයිදං බ්‍රහ්මචරියං ලාභසක්කාරසිලොකානිසංසං, න සීලසම්පදානිසංසං, න සමාධිසම්පදානිසංසං, න ඤාණදස්සනානිසංසං. යා ච ඛො අයං බ්‍රාහ්මණ අකුප්පා චෙතොවිමුත්ති, එතදත්ථමිදං බ්‍රාහ්මණ බ්‍රහ්මචරියං, එතං සාරං, එතං පරියොසානන්ති.

24. එවං වුත්තෙ පිඞ්ගලකොච්ඡො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම[1] සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය: චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

චූළසාරොපමසුත්තං දසමං.

ඕපම්මවග්ගො තතියො.

**තස්ස වග්ගස්ස උද්දානං:**

මොළියඵග්ගුනරිට්ඨ ච නාමො අන්ධවනෙ කථි පුණ්ණනිවාපා
රාසි කණෙරු මහාගජනාමා සාරුපමො[2] පුන පිඞ්ගලකොච්ඡො,
එස වරො ඨපිතො අසමොයං වාරුතරො තතියො වරවග්ගොති*.

---

1. ගොතම -පෙ- උපාසකං, මජ්ඣං. සභා. 2. සාරවරො, සීමු සභා.
* පාදෙයං මජ්ඣං පොත්ථකෙ නදිස්සති

22. බමුණ, නැවත ද අනිකක් වෙයි. මහණ තෙමේ සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිතනිරොධයට පැමිණ වාසය කරයි. ප්‍රඥාවෙන් දැකීම් හෙතුවෙන් ඔහුගේ ආස්‍රවයෝ ක්‍ෂය වූ වාහු වෙත්. බමුණ මේ ද ඥානදර්‍ශනයට වඩා උත්තරිතර වූ ද ප්‍රණීතතර වූ ද ධර්‍මයකි.

බමුණ, මේ ධර්‍මයෝ ඥානදර්‍ශනයට වඩා උත්තරිතර ද ප්‍රණීතතර ද වෙත්.

බමුණ, යම් සේ හර ප්‍රයෝජන කොට ඇති හර සෙවීමෙහි හැසිරෙන්නා වූ ඒ පුරුෂ තෙමේ යම් සේ නො වැපී පවත්නා වූ හර ඇති මහ රුකෙක හර යයි දනිමින් හරයම කපා ගෙණ ගියේ ද, ඔහුට හරයෙන් කට යුතු වූ යමක් වී නම් හරය පිළිබඳ ඒ ප්‍රයොජන ය ද ලබන්නේ ය. බමුණ, මම මේ පුද්ගලයා එබඳු උපමා ඇත්තෙකැ යි කියමි.

23. බමුණ, මෙසේ වනාහි මේ බඹසර ලාභසත්කාරකීර්තිප්‍රශංසා අනුසස් කොට ඇත්තේ නො වේ. ශීලසම්පත්තිය අනුසස් කොට ඇත්තේ නො වේ. සමාධිසම්පත්තිය අනුසස් කොට ඇත්තේ නො වේ. ඥානදර්‍ශනය අනුසස් කොට ඇත්තේ නො වේ. බමුණ, යම් මේ අකොප්‍ය වූ චිත්තවිමුක්තියෙක් වේ ද, බමුණ මේ බඹසර එය ප්‍රයොජනය කොට සිටියේ ය. ඒ සාරය යි. ඒ කෙලවර යි.

24. මෙසේ වදාළ කල්හි පිඞ්ගලකොච්ඡ බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේ ය: භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනව. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනව. භවත් ගෞතමයන් වහන්ස, යම් සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේ ද, වැසූ දෙයක් විවෘත කරන්නේ ද, මං මුළා වූවකුට මග කියන්නේ හෝ වේ ද, ඇස් ඇත්තෝ රූප දක්නාහුය යි අන්ධකාරයෙහි තෙල් පහනක් දල්වන්නේ ද, එපරිද්දෙන් ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ලෙසින් ධර්‍මය දෙශනා කරන ලද්දේ ය. ඒ මම භවත් ගෞතමයන් වහන්සේ ද ධර්‍මය ද භික්‍ෂු සඞ්ඝයා ද සරණ කොට යෙමි. භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිහිම් කොට සරණ ගිය උපාසකයෙකු කොට දරණ සේක් වා.

චූලසාරොපම සූත්‍රය දසවැනි යි.

තුන්වැනි ඔපම්ම වර්ගය යි.

**ඒ වර්ගයෙහි උද්දානය.**

මොළියඵග්ගුණය අරිට්ඨය යි භික්‍ෂු නාමයෙන් කී කකචූපම - අලගද්දූපම දෙසූත්‍ර ය, 'අන්ධවනෙ'යි ස්ථාන නිර්දිෂ්ට වම්මික සූත්‍රය, දසකථා ඇති පුණ්‍ණ සවු නමින් කී රථවිනීත සූත්‍රය, නිවාප සූත්‍රය, 'රාසි' යි නාමෛකදෙශග්‍රහණයෙන් කී පාසරාසි හෙවත් අරියපරියෙසන සූත්‍රය, කණෙරු - මහාගජ නාමයෙන් කී චූලහත්ථිපදොපම - මහාහත්ථිපදොපම් දෙ සූත්‍රය, මහාසාරොපම සූත්‍රය, යළි පිඞ්ගලකොච්ඡ නම් දුන් චූලසාරොපම් සූත්‍රය යි - මෙතෙකින් නැබූ මේ උතුම තෙවන වග අසම ය. අතිශයින් මනොඥ ය.

# 1. 4. 1.

## 4. මහායමකවග්ගො

### චූළගොසිඞ්ගසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා නාදිකෙ[1] විහරති ගිඤ්ජකාවසථෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා ච අනුරුද්ධො ආයස්මා ච නන්දියො ආයස්මා ච කිම්බිලො[2] ගොසිඞ්ගසාලවනදායෙ විහරන්ති. අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා[3] වුට්ඨිතො යෙන ගොසිඞ්ගසාලවනදායො තෙනුපසඞ්කමි.

2. අද්දසා ඛො දායපාලො භගවන්තං දූරතොව ආගච්ඡන්තං දිස්වාන භගවන්තං එතදවොච: "මා සමණ, එතං දායං පාවිසි. සන්තෙත්ථ තයො කුලපුත්තා අත්තකාමරූපා විහරන්ති මා තෙසං අඵාසුමකාසී"ති.

3. අස්සොසි ඛො ආයස්මා අනුරුද්ධො දායපාලස්ස භගවතා සද්ධිං මන්තයමානස්ස. සුත්වාන දායපාලං එතදවොච: 'මා ආවුසො දායපාල, භගවන්තං වාරෙසි. සත්ථා නො භගවා අනුප්පත්තො'ති.

4. අථ ඛො ආයස්මා අනුරුද්ධො යෙනායස්මා ච නන්දියො ආයස්මා ච කිම්බිලො තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා ආයස්මන්තඤ්ච නන්දියං ආයස්මන්තඤ්ච කිම්බිලං එතදවොච: 'අභික්කමථායස්මන්තො, අභික්කමථායස්මන්තො, සත්ථා නො භගවා අනුප්පත්තො'ති.

5. අථ ඛො ආයස්මා ච අනුරුද්ධො ආයස්මා ච නන්දියො ආයස්මා ච කිම්බිලො භගවන්තං පච්චුග්ගන්ත්වා එකො භගවතො පත්තචීවරං පටිග්ගහෙසි. එකො ආසනං පඤ්ඤපෙසි. එකො පාදොදකං උපට්ඨපෙසි. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. නිසජ්ජ[4] ඛො භගවා පාදෙ පක්ඛාලෙසි. තෙපි ඛො ආයස්මන්තො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.

6. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං අනුරුද්ධං භගවා එතදවොච: කච්චි වො අනුරුද්ධා ඛමනීයං? කච්චි යාපනීයං? කච්චි පිණ්ඩකෙන න කිලමථාති?[5]

7. "ඛමනීයං භගවා, යාපනීයං භගවා. න ච මයං භන්තෙ පිණ්ඩකෙන කිලමාමා"ති.

---

1 නාතිකෙ, මජසං. 2 කිම්ලො, මජසං සභා. 3. පටිසල්ලාණා, මජසං. සභා.
4. නිසජ්ජ පාදෙ, සභා. 5. කිලමිත්ථාති, සභා. 6. කිලමිම්හ, සභා.